# ජාතික ගොවි කටයුතු නියැදි සමීක්ෂණයේ කඩිනම් ප්‍රවෘත්ති සේවාවෙන් හෙළි වෙන

ජාතික ගොවිකටයුතු නියැදි සමීක්ෂණය යනු කුමක්ද යන්න පිළිබඳව 1978 සැප්තැම්බර් කලාපයෙන් පැහැදිලි කළෙමි. මේ ලිපියෙන් අදහස් කරනුයේ මේ සමීක්ෂණය හා එක්ව ක්‍රියාත්මක කරන ලද කඩිනම් ප්‍රවෘත්ති සේවාව මගින් රැස් කරන ලද ගොවි ගැටළුවල ස්වභාවය පිළිබඳව අවධානය යොමු කරලීමයි.

කඩිනම් ප්‍රවෘත්ති සේවාවේ මූලික අරමුණ වන ලද්දේ සමීක්ෂණයට භාජනය වූ වගා කන්නයන්තුළදී (1978 යල සහ 1978/79 මහ) විමර්ශකයින් විසින් රැස් කරන ලද ගොවීන් මුහුණපාන ලද නිෂ්පාදන හා අලෙවි ගැටළු අදාළ ආයතන වෙත යොමු කොට වගා කටයුතු පහසුකරලීමට අවශ්‍ය පියවර ගැනීමයි. මුලදී අප වෙත වාර්තා කළ ගැටළු ක්‍රියාත්මක ආයතන වෙත යොමු කරලීමට අදහස් කලද, මෙම අරමුණ ක්‍රමානුකූලව ක්‍රියාත්මක කළහැකි යෝග්‍ය යන්ත්‍රයක් ක්ෂේත්‍ර මට්ටමේ නොමැතිකමේ හේතුවෙන් ගැටළු දිස්ත්‍රික්කය භාර දිසාපති වරයාට පිටපතක් සහිතව, ප්‍රදේශයේ උප දිසාපති වරයාට යොමු කිරීමට තීරණය කෙරිණි. කෙසේ වෙතත් අලෙවි ගැටළු අප වෙත වාර්තා වූ සැනින් ඒවා අදළ දිස්ත්‍රික්කයේ උප දිසාපති වරයා වෙත ඉදිරිපත් නොකොට අවශ්‍ය පියවර ගැනීමට යුහුසුළු වීමු. 1978 යල කන්නය තුළ මාතලේ දිස්ත්‍රික්කයේ තක්කාලි නිෂ්පාදනය අලෙවියේදී මතු වූ ප්‍රවාහන දුෂ්කරතාව මහ හැර වීම සඳහා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ගැටළුව යොමු කොට අවශ්‍ය පියවර ගැනීම උදහරණයක් ලෙස දැක්විය හැක.

මෙසේ 1978 යලකන්නයේදී ගොවීන් මුහුණ දුන් ගැටළුද 1978/79 මහ කන්නයේ මුල් අවධියේ අප වෙත වාර්තා කළ ගැටළුද සළකා බැලීමේදී මූලික ගොවි ගැටළුවල ස්වරූපය පිළිබඳව දළ නිගමනයක් කරා එළඹිය හැක. කෙසේ වෙතත් සමීක්ෂණයට භාජනය කරනු ලැබූ ගොවි පවුල් ප්‍රමාණය ස්ථිරගත නියදීම හේතුකොට ගෙන දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස්වීම නොවැළැක්විය හැක්කකි. උදහරණයක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් සමීක්ෂණය සඳහා තෝරාගෙන ඇති ගම්ප්‍රමාණය 71 ක් වන අතර අම්පාර, ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රික්කයන්ගෙන් තේරී ඇත්තේ ගම් 6 බැගිනි. මෙය මුළුමනින්ම සමීක්ෂණ ක්‍රම විධිය හා සම්බන්ධ වූවකි. මේ අනුව දිස්ත්‍රික්කයන් අනුව මුහුණපාන ගැටළු වර්ග කිරීමකට වඩා සමීක්ෂණයට භාජනය වූ සමස්ත ගොවිපවුල් මුහුණපාන ගැටළු වර්ග කිරීමකට භාජනය කිරීම යෝග්‍ය යැයි හඟිමු. කෙසේ වෙතත් සමහර දිස්ත්‍රික්කයන්ට සුවිශේෂ වූ ගැටළු වෙන් කොට දක්වා ඇත. ගොවීන් මුහුණ පාන ගැටළු වගාකන්නයත් අනුවද වෙනස් වේ.

## ගොවි ගැටළු

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි
**එච්. ඒ. රණබන්ඩා විසිනි**

උදහරණයක් ලෙස යල් කන්නයේදි වාර්තා ගත වූ ගැටළු වලින් විශාල ප්‍රමාණයක් ජල ප්‍රශ්නය හා සම්බන්ධ වූ ඒවාය. වගාකන්නය තුළ මුහුණපාන ගැටළුවලට ඉක්මන් විසඳුම් ගැනීම සඳහා අදාළ ආයතන වෙත යොමු කිරිම අපගේ අරමුණ වුවද සමහර ගොවීන් විසින් වාර්තා කොට ඇති ගැටළු වර්ෂ ගණනාවක සිටම ඔවුන් මුහුණ දෙන ඒවා වීමද විශේෂ ලක්ෂණයකි. වැව් ප්‍රතිංසස්කරණ කටයුත්තක් කඩිනම් කරන ලෙස කෙරෙන ඉල්ලීමක් හෝ අළුත් වාරි මාර්ග ක්‍රමයකින් ජල පහසුකම් සළසාදෙන ලෙස කෙරෙන ඉල්ලීම් මේ ගනයේ ලා සැළකිය හැක.

අප වෙත යොමු කල ගැටළු 384 ක් ඒවායේ ස්වභාවය අනුව ඉඩම්, ජලය, මුදල්. යෙදවුම් හා උපකරණ, ප්‍රවාහන, අලෙවි, ස්වභාවික විපත් හා අනෙකුත් උවදුරු ලෙස පුළුල් වර්ග කිරීමකට භාජනය කෙළෙමු. මේ අතුරෙන් 36.5 % ක් පමණ වන විශාල ප්‍රතිශතයක් යෙදවුම් හා උපකරණ ලබා ගැනීමේ දුෂ්කරතා ලෙස වාර්තාගතව ඇත. මේ අතර බීජ හා රෝපන ද්‍රව්‍ය, මී හරක්, ට්‍රැක්ටර්, උදළු, බෙහෙත් ඉසින, පෝර හා කෘෂි රසායන ද්‍රව්‍ය සහ ශ්‍රමිකයන් සපයා ගැනිමේ දුෂ්කරතා ප්‍රධානය. මෙවැනි යෙදවුම් කලට වේලාවට ලබා ගැනීමට නොහැකි බව හෝ අධික මිළ ගෙවා ලබා ගැනීමට සිදුවීම හෝ සමුපකාර ප්‍රාදේශිකයන්හි හෝ වෙනත් කිසිම අලෙවි මධ්‍යස්ථානයක නොමැතිකම ගැටළුවක් ලෙස වාර්තාගතව ඇත. වාර්තාගතව ඇති ගැටළුවලින් 14.9%ක්ම පෝර හා කෘෂි රසායන ද්‍රව්‍ය හා සම්බන්ධ වේ. එමෙන්ම මෙම ගැටළුව සෑම දිස්ත්‍රික්කයකින්ම පාහේ වාර්තා ගත වීම විශේෂයකි. රත්නපුර, බදුල්ල සහ නුවරඑළිය වැනි දිස්ත්‍රික්කයන්හි සුළු පරිමාණයේ වතු හිමියන්ට අවශ්‍ය පොහොර ප්‍රමාණයන් කුඩා ප්‍රමාණවලින් සමුපකාර ප්‍රාදේශිකයන්ගෙන් ලබා ගත නොහැකි බවත්, ඒවා විශාල මළු වලින් පමණක් ලබා ගැනීමට සිදු වීම ගැටළුවක් බවද වාර්තා විය. ගොවීන්ගේ අවශ්‍යතාවන් අනුව පොහොර නිකුත් කළ හැකි ක්‍රමයක් මෙවැනි දිස්ත්‍රික්කයන් සඳහා පමණක් හෝ ක්‍රියාත්මක කළහැකි නම් එය අගය කොට සැළකිය හැක්කකි.

එළවළු බීජ කලට වේලාවට ලබා ගැනිමට දුෂ්කර එකක් බැව් නුවරඑළිය, බදුල්ල දිස්ත්‍රික්කයන්ගෙන්ද පොල් පැල නොමැතිකම කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ද, හේන් ගොවිතැන සඳහා අවශ්‍ය වන එළවළු බීජ සපයා ගැනීම දුෂ්කර බැව් හම්බනතොට දිස්ත්‍රික්කයෙන්ද වාර්තා විය. වවුනියාව, පොළොන්නරුව, අනුරාධපුරය, හම්බන්තොට හා අම්පාර දිස්ත්‍රික්කයන්ගෙන් ශ්‍රමිකයන් සපයා ගැනීම දුෂ්කර බව හා ට්‍රැක්ටර් කුලිය ඉතා ඉහළ එකක්වීම නිතර වාර්තා වූ ගැටළුවකි. කිඹුලා උදළු නොමැතිකම සෑම දිස්ත්‍රික්කයකට මෙන් පොදු වූ ගැටළුවකි. බෙහෙත් ඉසිනයන් සපයාගැනීමේ දුෂ්කරතාව නිසාම රෝග පැතිර යාම නොවැළැක්විය හැක්කක් බව රත්නපුර, හම්බන්තොට, මාතලේ, බදුල්ල යන දිස්ත්‍රික්කයන්ගෙන් වාර්තා විය.

අප වෙත ලැබුන ගැටළු වලින් 27.4%ක්ම ජලය හා සම්බන්ධ ඒවාය. ජලය හිඟකම පිළිබඳ වියළි කලාපයේ සෑම දිස්ත්‍රික්කයකින්ම මෙන් වාරතා වූ අතර ජලය වැඩිකම පිළිබඳ ගාල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්ගෙන් වාර්තා විය. ජලය මනාව බෙද දී නොමැතිකම අම්පාර, හම්බන්තොට, මොණරාගල හා වවුනියාව, කුරුණෑගල හා පොළොන්නරුව දිත්‍රික්කයන්හි මූලික ගැටළුවකි. අම්පාර දිස්ත්‍රිකකයෙන් ලැබුණ ගැටළු සියල්ලම පාහේ ජලය බෙද හැරීම හා සම්බන්ධ ඒවාය. ජලය බෙදහරින මුර වාර ක්‍රමය වෙනස් කොටජලය නිකුත් කරන දින ගණන වැඩි කරන ලෙසද එක් ගැටළුවක සඳහන් විය. ගැටළු වලින් 15.4%ක්ම වැව් ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස හෝ ජලය බෙදහරින ඇල වේලි පිළියකර දෙන ලෙස හෝ ජල හිඟය ඉවත් කරලීමේ පියවරත් ලෙස කල ලිං ක්‍රමය ඇති කරන ලෙස කෙරෙන ඉල්ලීම් හා අදළ වේ.

වගා කටයුතු සඳහා මුදල් නොමැතිකම හෝ ඉල්ලන ලද ණය මුදල් වුවද නියමිත

වේලාවට නොලැබෙන බැව් කියවෙන ගැටළු 6.8% කි. ප්‍රවාහන අපහසුකම් හා අදාළ ගැටළු 2.3 කි. මාර්ගවල අබලන් තත්වය නිසා අස්වැන්න ප්‍රවාහනය කළ නොහැකි බව හෝ ප්‍රවාහනය සඳහා අවශ්‍ය කරන ලොරි හෝ ට්‍රැක්ටර් සපයා ගැනීම දුෂ්කර බව කියවෙන ගැටළුද මේ අතර වේ. රත්නපුර, නුවරඑළිය, මොණරාගල, වවුනියාව සහ හම්බන්තොට ප්‍රවාහනය ගැටළුවක් බව වාර්තා කළ දිස්ත්‍රික්කයන් අතරවේ.

ඉඩම් භුක්ති හා අදාළ ගැටළු 2% ක් වන අතර එය නුවරඑළිය, මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කයන්ට සීමා වූවකි. අඳ ගොවීන්ට සිදු වන අසාධාරණකම් ගැන කියවෙන ගැටළුද ඉඩම් ප්‍රතිසංස්කරණය තුළින් මතු වූ භුක්තිය පිළිබඳ ගැටළුද මේ අතර ප්‍රධානය.

කෘමි උවදුරු හෝ රෝග, එසේත් නැත්නම් වල් සතුන්ගෙන් හෝ පක්ෂීන්ගෙන් වන හානි පිළිබඳ ගැටළු 10.4% කි. ගොවීන්ට රෝග හඳුනා ගැනීමට ඇති දුෂ්කරතාව සහ ඒවාට යෙදිය යුතු නිසි බෙහෙත් වර්ග පිළිබඳ අවබෝධයක් නොමැතිකම පිළිබඳ සඳහන් කෙරෙන ගැටළුද බහුලය. තමන්ට ව්‍යාප්ත සේවා හරියාකාර නොලැබෙන බවත්, තමන් යොදන බෙහෙත් වර්ග හා පොහොර වලින් නිසි ඵල නොලැබෙන හෙයින් ඒ පිළිබඳ තමන්ගේ විශ්වාසයක් නොමැති බවද සමහර ගැටළුවල සඳහන් වේ. රක්ෂණ වාරිකයන් නිසි පරිදි ගෙවා ඇති මුත් රක්ෂණ වන්දි ලබා ගැනීමට කල් ගත වන බවත් සමහරවිට නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවයන් හේතුකොට ඒවා කොහෙත්ම නොලැබෙන බැව් කියවෙන ගැටළුද අප වෙත ලැබී ඇත.

අලෙවිය හා සම්බන්ධ ගැටළු 7.2% කි. වී, උක්, තල, රබර්, තේ සහ එළවළු නිෂ්පාදනයන් අලෙවි දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇත. එසේම නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමහර කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයන්ට කිරි අලෙවි කළ නොහැකි බැව්ද දැක්වෙන ගැටළුද අප වෙත ලැබිණි. රබර් සහ තේ අලෙවියේදී නොයෙකුත් දුෂ්කරතාවයන්ට මුහුණපා ඇත්තේ සුළු ඉඩම් හිමියන්ය. බොහෝවිට මෙම ගැටළු ප්‍රවාහන දුෂ්කරතාවයන් හා සම්බන්ධ වේ. තේ දළු මිළදී ගැනීමේ ස්ථානයන් නොමැතිකම හෝ ඒවායේ දුර බැහැරකම නැතහොත් මිළදී ගන්නා තේ දළුවල ස්වභාවය පිළිබඳ දැඩි සළකා බැලීම මේ ගැටළු අතර ප්‍රධානය. උක් අලෙවිය දුෂ්කරව ඇත්තේ මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි කුඩා පරිමාණ නිෂ්පාදකයන්ටය. එයද ප්‍රවාහන දුෂ්කරතාව හා සම්බන්ධවූවකි. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය මේ කාර්යයේදී ප්‍රමාණවත් ලෙස මැදිහත් වීමෙන් ප්‍රවාහන දුෂ්කරතාව මග හරවා ගත හැකි බැව් අපගේ විශ්වාසයයි.

වී අලෙවිය දුෂ්කර එකක්ව ඇත්තේ සමහර විවිධ සේවා සමුපකාර සමිති මුදල් නොමැතිකම නිසා හෝ ගබඩා පහසුකම් නොමැතිකම නිසා වී මිළදී ගැනීම ප්‍රතික්ෂේප කිරීමේ හේතුවෙනි.

තේ සහ රබර් නැවත සිටුවීමේ ආධාර ක්‍රම ගැන ප්‍රමාණවත් වියතර තමන් නොදන්නා බවත් ඒ පිළිබඳ සහනාධාර බලාපොරොත්තු වන බැව් දැක්වෙන ගැටළු 4.7% කි. මෙය රත්නපුරේ දිස්ත්‍රික්කයේ ගොවීන් නිතර අප වෙත යොමු කළ ගැටළුවකි. ඒ හැර මහනුවර, නුවරඑළිය, බදුල්ල සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්ගෙන්ද මේ පිළිබඳව වාර්තා වී ඇත.

ඉහත දැක්වූ ගැටළු නිරීක්ෂණයේදී යෙදවුම් උපකරණ හිඟකම ගොවීන් මුහුණපාන ප්‍රධාන මූලික ගැටළුව බව පැහැදිලිය. රෝග පැතිර යාම හා අස්වැන්න අඩු වීම කෙරේ කලට වේලාවට කෘමිනාශක හා පොහොර වර්ග සපයා නොදීමෙන් ඇති කෙරෙන බලපෑම අමතක කළයුතු නොවේ. මෙම සමීක්ෂණයේදී සමහර දිස්ත්‍රික්කයන්හි යල හා මහ කන්නයන් නිසියාකාරව ක්‍රියාත්මක වන බවක් පෙනෙන්නට නොතිබුණි. ගොවීන්ට කන්න රැස්වීම්වලදී ප්‍රකාශිත කාල සටහන හා අනුකූල වීමට නොහැකිව ඇති එක් හේතුවක් නම් මෙම යෙදවුම් සැපයුමේ ඇති නොයෙකුත් අඩුලුහුඬුකම්ය. මේ හැර ක්‍රමවත් ජල පාලන ක්‍රමයක් නොවීමද ගැටළුව උග්‍ර කරලීමේදීලා හේතු වී ඇත. ගොවීන්ගේ මූලික ප්‍රශ්නය වී ඇත්තේ

(43 පිටුව බලන්න)

# ගොවි ගැටළු....

තිබෙන ජලය වුව හරියාකාරව බෙදා නො හැරීම බව ගැටළු විශාල ප්‍රමාණයකින්ම කියවේ. ඇල වේලි හරියාකාර ශුද්ධ පවිත්‍ර නොකිරීම හෝ කැඩී බිඳී ගිය ජල මාර්ග නොසලකා හැරීමද ප්‍රධාන ගැටළුවකි. ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව පැහැදිලි කරන ගැටළුද රාශියකි. කෘමි උවදුරු හා රෝග පැතිර යාම වැළැක්වීමට අවශ්‍ය ව්‍යාප්ත සේවා හරියාකාරව ගොවීන්ට නොලැබීම මෙය පැහැදිලි කරන එක් අවස්ථාවකි. එමෙන්ම, තේ, රබර්, පොල් වැනි බෝගයන් නැවත සිටුවීමේ සහනාධාර ක්‍රමයන් ගැන ගොවීන්ට අවබෝධයක් නොමැතිවීමෙන්ද රක්ෂණ වන්දි ලබා ගැනීමට අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙල පිළිබඳව ගොවීන්ට අවබෝධයක් නොමැතිවීමෙන්ද ගොවීන්ගේ යහපත සඳහා ඉදිරිපත්ව ඇති මෙම යෝජනා ක්‍රමයන් හරියාකාරව ඵල දරණ බවක් නොපෙනේ. ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් හා ගොවීන් අතර ඇති සම්බන්ධතාවයේ තරම අනුව විසඳා ගත හැකි ගැටළු ප්‍රමාණයද විශාල එකක් බැව් අමතක නොකළ යුතුය.